# අත්තම්මා



දෙසඳි දෙව්හාරා පතිරණගේ

**කෘතියේ නම :** අත්තම්මා

**කතෘගේ නම :** දෙසදි දෙව්හාරා පතිරණගේ

**කතෘගේ වෙනත් කෘති :** අපූරු තෑග්ග, අපි හොඳ යහළුවෝ

**2023 නොවැම්බර් මස 15 වන දින…**

ISBN 978-624-206-624-0

## පිදුම

මා හට අධ්‍යාපනය ලබා දීමට අපමණ කැපවීම් කරන

මගේ අම්මාට.......

මගේ තාත්තාට.......

මා අධ්‍යාපනය ලබන මහනුවර, මහා මායා බාලිකා විද්‍යාලයේ

විදුහල්පති තුමියට......

ගුරු මෑණිවරුන්ට......

ගුරු පියවරුන්ට......

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මහ පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපිය ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර<br>
විදුහල්පතිනිය<br>
මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර<br>
2023.11.01

වෙනදා මෙන්ම අදත් උදෑසනම හිරු කුමරා නැඟ ආවේ මුළු ගමටම ප්‍රබෝධයක් එක් කරමිනි. සුවඳවත් මල්, අහසේ රටා මවමින් පියඹා යන කුරුල්ලෝ, ඔවුන්ගේ විවිධ වූ නාද රටා උදෑසන සුන්දරවත් කරයි. අත්තම්මා ඒ සුන්දර පරිසරය දෙස බලා සිටියේ ප්‍රබෝධමත් මුහුණුවරකින්ය. දත් විලිස්සා සිනහ වන ඇය සුපුරුදු පරිදි බුලත් හෙප්පුව ලඟ තබාගෙන බුලත් හපමින් සිටියාය. සමහර අය ඇයට බුලත් කෑමේ අනිටු ප්‍රතිඵල පවසා තිබූ නමුත් එය නවතා ගැනීම ඇයට බොහෝ අසීරු කාර්යයක් විය. ඇයට බුලත් කෙල ගැසීමට තැනක් නොතැනක් නොතිබීය. ගමේ සිටම ගෙමිදුලට බුලත් කෙල ගැසීමට පුරුදුවී සිටි ඇය නගරයට ආ පසුවද එයම සිදු කළාය. ඇය බුලත් කෙල ගැසීමෙන් ගෙමිදුලේ රතුපාටට විවිධ රටා මැවී තිබුණි. මෙය දුටු කමලා නැන්දා  අත්තම්මාට බැන වැදුනේ පුරුද්දට මෙන්ය. වෙනදා මෙන් අත්තම්මා එය ගනන් නොගෙන සිටියාය. ඉන්පසු ගෙට ගොඩවූ කමලා නැන්දා ළමයි දෙදෙනාට පාසල් යාමට කතා කළේ තරහ මුසු මුහුණකින්ය. ඔවුන් දෙදෙනා ඉක්මනින්ම ලෑස්තිවී තාත්තාගේ කාරයට නැගගත්තේ කමලා නැන්දාට තරහ ගියහොත් ඔවුන්ටත් බැන වදින බව දනිමින්ය. නැවතත් දෙදෙනා කාරයෙන් බැස ගත්තේ යම් කිසි දෙයක් අමතක වුනාක් මෙන්ය. ඔවුහු අත්තම්මාට වැඳ නැවතත් කාරයට නැගගත්තාහ. තාත්තා, “මගේ හොඳ දූලා දෙන්නා” යනුවෙන් පවසමින් හිස අත ගැවේය. පසුව කමලා නැන්දා කාරය අසලට ඇවිත් මෙසේ පැවසුවාය. “මං කොච්චරවත් කියල තියෙනවාද මෙයාව මහලු නිවාසයකට එක්කන් යන්න කියල කෝ ඉතින් ඒක කනකට ගන්නෙ නැහැනේ” යනුවෙන් පවසමින් ඇය නිවස තුළට ගියාය.

අත්තම්මාට සුදහ ගින්දරක් ආ නමුත් ඇය එය නොදැනුනාක් මෙන්  සිටියාය. පසුව ඇය කුස්සිය පැත්තට ගාටා ගාටා ගියේ බත් පිගානක් බලාපොරොත්තුවෙන්ය. කුස්සියේ කවුරුත් නොසිටියේය. ඇය පිඟානයට බත් බෙදාගන්නා තුර නොඉවසිල්ලෙන් සිටියාය. බෙදාගත් බත් පිඟානය එක් හුස්මට කා දැමුවාය. ඉන්පසු ඇය වත්ත පහළ පිහිටි ළිඳ අසලට ගොස්  සීතල වතුරෙන් නැවාය.

ඇය නොවරදවාම ගමේ කඬේ අසලට යන්නේ සීලවතී ආච්චිත් සමඟ කතා කරනු පිණිසය. කඩය අසලට ගිය නමුත් සීලවතී ආච්චි එදින කඩය අසල නොසිටියාය. අත්තම්මා එතන ටික වෙලාවක් බලා සිටියාය. නමුත් සීලවති ආච්චි ආවේ නැත. පසුව ඇය කඬේ මුදලාලිගෙන් මෙසේ ඇසුවාය. “ඇ  මුදලාලි සීලවතී අද ආවේ නැත්තේ ඇයි කියල දන්නවද?” “ඇයි දන්නෙ

නැද්ද සීලවතී නැන්දාගේ මුණුපුරාව සර්පයෙක් දෂ්ට කළා කියල" මුදලාලි පැවසුවේය. "නැහැ මං එහෙම එකක් දන්නෙ නැහැ." "හරි එහෙම කියමුකෝ, ඉතින් මම හෙළ වෙදකම ගැන දන්නවනේ සීලවතීට මාව හම්බවෙන්න තිබ්බනෙ" යැයි අත්තම්මා පැවසුවාය. "දැන් කාලේ කොහෙද ගමේ ගොඩ වෙදකම් ඉන්ගිරිසි බෙහෙත් මිසක්" මුදලාලි කිව්වේය. "හා ඇත්තනේනම් එහෙනම් මම යන්නම්" අත්තම්මා එසේ කියා දුකෙන්ම යන්නට ගියාය. ඇය ගෙදරට ගොඩවෙනවාත් සමග කමලා නැන්දා "ආ මේ දහවලේ එක එකා එක්ක ඕප දූප දොඩවන්න ගියාද? අපි මේ ගමේම වැදගත් මිනිස්සු" කියා කමලා නැන්දා අත්තම්මාට හොඳටම බැන්නාය. අත්තම්මා ඒවා නොඇසුණා සේ සිටියාය.

අත්තම්මා ගේ ඇතුළට නොගොස් ගේ දොරකඩම ඉඳ ගත්තාය. පසුව අත්තම්මාට ඇසුණේ කෙනෙකුගේ අඩන හඩක්ය. අත්තම්මා ගේට්ටුව අසලට දුව ගියාය. ඉක්බිතිව ඇය දැක්කේ දරුවෙක් උස්සාගෙන අම්මා කෙනෙක් හඩමින් දිව එන ආකාරයයි. ඔවුහු නිවස අසලට පැමිණියහ. "ඇයි" අත්තම්මා ඇසුවාය. එවිට ඒ අම්මා "අනේ මෙයා වත්ත පහළ සෙල්ලම් කර කර ඉන්නකොට සර්පයෙක් දෂ්ට කරල ද කොහෙද හඩමින් පැවසුවාය. " ආ මේ පැත්තට ආවනම් මෙතනින් ළමයා හාන්සි කරන්නකො ම්..... එච්චර භයානක තත්ත්වයක් නම් පේන්න නෑ. අත්තම්මා ටික වේලාවක් නිහඬව සිටියාය. ඊට පස්සේ තෙල් ටිකක් අතට ගෙන හෙමිහිට පිරිමැන්දාය. හරි, මේ තෙල් ටික උදේ හවා ගෑවානම් හරි" අත්තම්මා කීවාය. එවිට කමලා නැන්දා දොර පිටුපස සිට එබිකම් කළාය. ඉක්බිතිව ඒ දරුවගේ අම්මා අත්තම්මා දෙසට මුදල් දික් කළාය. "සල්ලි නොදුන්නට කාරි නෑ ළමයෝ" යැයි අත්තම්මා පැවසුවාය. එවිට කමලා නැන්දා දොර පිටුපස සිට එළියට ආවාය. ඇය මෙසේ කීවාය. "නෑ නෑ අද කාලේ සල්ලි නැතුව මොනවත් කරන්න බෑ කෝ ඔය සල්ලි දෙන්නකො" ඉන්පසු ඇය අත්තම්මාට සල්ලි දෙන්න යන විට ම කමලා නැන්දා එය උදුරා ගණන් කර බැලුවාය. ඉන් පසු ඇය ගෙට ගියාය. ඔය ළමය එහෙනම් යන්නකො "අනේ නැන්දට බොහොම පින්" යැයි ඇය කියා නිවසින් පිටව ගියාය.

ටික වේලාවකට පසුව ළමයි දෙදෙනා පාසල නිමවී ගෙදර ගොඩවූහ. මූණ කට සෝදා කෑම කා නොඉවසිල්ලෙන් දොරකඩ ළඟට ගියහ. ඔවුහු දොරකොඩ අසල ඉඳ ගත්හ. "අත්තම්මා අද අපිට කතාන්දරයක් කියල දෙනව නේද" යැයි නිශානි අත්තම්මාගෙන් ඇසුවාය. "නැත්තන් ඉතින්" කියා අත්තම්මා පවසන විට කමලා නැන්දා පැමිණියාය. "නෑ නෑ කෑවනම් බිව්වනම් ගිහින් නිදාගන්නවා. හෙට උදෙන්ම ඉස්කොලේ යන්න නැගිටින්නත් එපාය" යැයි ඇය දරුවන්ට බැණ

වැඳුණාය. පසුව අත්තම්මා “දරුවන්ට බැනල වැඩක් නැහැ මමනේ වැරදි මට බනින්න” කියා කීවාය. ඉක්බිතිව කමලා නැන්දා අත්තම්මාට බනින්නට සූදානම් වන විට ම ළමයි දෙදෙනා කාමරය තුළට රිංගා ගත්හ. ටික වේලාවකට පසුව තාත්තා ගෙදර ආවේය. කමලා නැන්දා කාරය ඉදිරිපසට පැමිණියේ තාත්තාට කේලමක් කීමට බව අත්තම්මාට වැටහුණි. තාත්තා කාරයෙන් බැස්සේය. “ආ ඇයි” තාත්තා ඇසුවේය. ගෙට යමුකො කියන්න, “මේ ඔයාගේ අම්මානම් මහ කරදරයක් වෙලා තියෙන්නෙ එයා එක එකාගේ ඕපදූප කියන්න යනවා මිසක් අපට කිසිම දෙයක් කරල දෙනවද? එයා අපටත් ලැජ්ජා කරනවා අපි මේ ගමේ වැදගත් මිනිස්සු” ඇය මුළු ගමටම ඇසෙන්න කෑ ගැසුවාය. “හරි, අම්මා හින්දනේ මෙච්චර ප්‍රශ්න මම අම්මව හෙට උදෙන්ම වැඩිහිටි නිවාසයකට එක්කන් යන්නම්. හරිනේ එතකොට” තාත්තා කීවේය. එවිටම අත්තම්මා ගෙයින් එළියට බැස දොරකොඩ අසල වාඩි වුනාය. අත්තම්මාගේ දෑස්වලින් කඳුළු කැට කඩා වැටුණි. බුලත් සපමින් සිටි අත්තම්මා බුලත් හපය ද එළියට විසිකරමින් කාමරයට ගියාය. ඇය බෑගයක් ගෙන අල්මාරියෙන් ඇඳුම් රැගෙන බෑගයට දැමුවාය. එවිට කමලා නැන්දා කාමරයට ගොස් මෙසේ කීවාය. “අන්න හරි ඕක කලින්ම කරන්න තිබුණනේ” අත්තම්මා බිම බලාගෙන සිටියාය. පසුව අත්තම්මා නින්දට වැටුණාය. “කුඩම්මා හරි නපුරුයි නේද නංගි” අක්කා නංගිට කීවාය. “ඔව් එයා හැම එකකටම කට දානවා” යැයි නිශානි කීවාය. අත්තම්මා රාත්‍රි කෑම මේසටයට ද එක් වූයේ නැත. එය රෑ කෑම මේසයට ලොකු අඩුවක් විය. ළමයි දෙදෙනා රාත්‍රි නින්දට ගියේ මහත් කණගාටුවෙන්ය.

පසුදා උදා විය. අත්තම්මා වැඩිහිටි නිවාසයකට යෑමට සූදානම් වී නිවසින් එළියට ආවාය. කිසිදාක අත්තම්මට වැන්දේ නැති කමලා නැන්දා අද අත්තම්මාට වැන්දාය. ඇය කමලා නැන්දාට ආශිර්වාද කළාය. ළමයි අත්තම්මාට වැන්දේ ඇඩූ කඳුලෙනි. තාත්තාත් අත්තම්මාට වැන්දේය. එහෙනම් හැමෝටම තුණුරුවන්ගේ සරණයි! කියා අත්තම්මා කාරයට නැන්ගාය.“දුවේ මං අත්තම්මා දාල එනකල් ඔය දෙන්න ඉන්නවද? මොකද ඉස්කෝලෙයි වැඩිහිටි නිවාසයයි තියෙන්නෙ දෙපැත්තකනෙ” “බෑ අපිට යන්න පරක්කු වෙනව” ඔවුහු අත්තම්මාගේ ගමන යන්නෙ නැති පැත්තට කතා කළහ. “එහෙම බෑ අපිට යන්න වෙනවා”. කියා තාත්තා සහ අත්තම්මා පිටත්වූහ.

ඉක්බිතිව ළමයි දෙදෙනා නිවස අසල පිහිටි අඹ ගසක අඹ ගෙඩි පිරී තිබුණ අයුරු දැක අඹ ගස අසලට ගියහ. අක්කා අඹ ගස උඩට නැග්ගාය. නංගි බිම සිටියාය. අක්කා බිම නොබලා “ආ

අල්ලගන්න" යයි පවසා අඹ ගෙඩියක් බිමට දැම්මාය. එය බිමට වැටෙන ශබ්දය ඇසුණි. පසුව අක්කා බිම බැලුවාය. ඇය බියෙන් හා පුදුමයෙන් මෙන් ගසෙන් බිමට හනිකට බැස්සාය. අත්තම්මලා ටික දුරක් ගොස් අවසන් නමුත්, අත්තම්මාට කිසිවකු කෑ ගසන හඬ ඇසුණාය. එය "අත්තම්මා" යන හඬයි. අත්තම්මා ආපසු හැරී බලන්නට විය. "පුතේ ඒ ලොකු දුවගෙ කටහඬනේ අපි යමුකො බලන්න" අත්තම්මා පැවසුවාය. පසුව ඔවුහු නැවත හැරී ආහ. "අනේ මගේ මිණිපිරීට මොකද වුනේ, බිම වැටී සිටි නංගි දෙස බලමින් අත්තම්මා කීවාය. ''දෙයියනේ, සර්පයෙක් කාලා වගෙයි" යැයි කියමින් අත්තම්මා කෑ ගසමින් නංගිව වඩාගෙන ගොස් ඇඳ මත තැබුවාය. අත්තම්මා ටික වේලාවක් නංගිගේ කකුලේ සර්පයා දෂ්ට කල ස්ථානය පරීක්ෂා කළාය. අත්තම්මා ගෙයි අතුළට දිවගොස් අතින් යමක් රැගෙන ඇවිත් නංගිගෙ කකුලෙ සෙමින් පිරිමදින අයුරු දැක්කෙමි. ටික වේලාවකට පසුව "නංගිට දැන් සනීපයි" අක්කා කීවාය. තාත්තා නංගි ළඟට දුවගෙන ආවාය. සියළු දෙනාම ඇය ආදරයෙන් බදා ගත්තාය. ඉක්බිතිව අත්තම්මා මෙසේ කීවාය. "ඔන්න මං මගේ යුතුකම ඉටු කළා, එහෙනම් මම යන්නම්, යං පුතේ'' "නෑ නෑ අම්මා කොහේවත් යන්නෙ නෑ අම්මා මේ ගෙදරම ඉන්න ඕන" ඒ කමලා නැන්දාගේ හඬයි. අත්තම්මා පුදුමයට පත් වුණාය. ළමයින්ටත් එය අදහාගත නොහැකි විය. ''අම්මට මගෙන් ගොඩක් වැරදි සිද්ධ වුනා මට සමාවෙන්න'' කියමින් ඇය අත්තම්මා වැළඳ ගත්තාය. සියළු දෙනාම අත්තම්මා ළඟට දුවගොස් ඇයව වැළඳ ගත්හ. ඉක්බිතිව සියළු දෙනාම සාමයෙන් හා සතුටින් යුතුව එකට ජීවත් වූහ. ..........

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුනගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දි මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්ප්‍රදානය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවක් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපන දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුපම් කරුවන්ට මෙන්ම සමාජයේ  වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමයා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහා ලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023.11.01